රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 19/94

මගේ අංකය :- III/0266/2/68(පොදු)
එල්/එච්.ඒ/II
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.05.23 වැනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

වැටුප් ණය - <u>ආයතන සංග්‍රහයේ **XXIV**</u>
<u>වන පරිච්ඡේදය</u>

උක්ත පරිච්ඡේදයේ 3:6 හා 10:3 වගන්තිවල සඳහන් "මාස 06 ක වැටුප" යන කොටස ඉවත් කර ඒ වෙනුවට "මාස 10 ක වැටුප" යන්න ආදේශ කරන්න.

02. ඔබ අමාත්‍යාංශයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබේ නම් ඉහත ජේදයේ සඳහන් පරිදි වැඩි කරන ලද මුදලේ ඉතිරිය මෙම චක්‍රලේඛය නිකුත් කරන දිනට පෙර මාස 06 ක ආපදා ණය මුදල ලබාගත් නිලධාරීන්ට ද ලබා දිය හැකිය.

03. මෙම ණය මුදල යළිත් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ආයතන සංග්‍රහයේ XXIV වෙනි පරිච්ඡේදයේ 10:6 වගන්තිය පරිදි අලුත් ණය ලබා ගත් දින සිට 06 මාසයක් ඉකුත් වූ පසුවය.

04. 1990.03.06 සහ 1990.04.18 දිනැති අංක: 13/90(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මෙයින් අවලංගු කරමි.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.